විජිතාරාමය
Vijitharamaya

26, විජිතාරාම පටුමග, ඇඹුල්දෙණිය, නුගේගොඩ.
26, Vijitharama Lane, Embuldeniya, Nugegoda, Sri Lanka.
Tele: +94 112833328 Email: vijitharama@yahoo.com
Website: vijitharama.org

# විජිතාරාම විහාරස්ථානයට අනුබද්ධ සංඝ සරණ පදනම ශිෂ්‍යත්ව ප්‍රදාන වැඩසටහන

## හැදින්වීම

උඩහමුල්ල, විජිතාරාම විහාරස්ථානයට අනුබද්ධව 2018 මාර්තු මස 22 වන සිකුරාදා විජිතාරාම විහාරස්ථානයේදී පිහිටුවා ගන්නා ලද සංඝ සරණ පදනම ශ්‍රී ලංකාවේ සාමනේර භික්ෂුන් වහන්සේලාගේ පවුල්වල අධ්‍යාපනය ලබන සහෝදර සහෝදරියන්ට ඔවුනගේ අධ්‍යාපන කටයුතු සඳහා උදව් උපකාර කිරීම අපේක්ෂාවෙන් සංස්ථාපනය කර ඇත. අවශ්‍ය අරමුදල් සම්පාදනය කිරීම සඳහා දෙස් විදෙස් දානපතීන්ගේ ආධාර උපකාර භාවිතයට ගනිමින් මෙම පදනමේ අරමුණු සපුරාගැනීමට අපේක්ෂා කෙරේ. විජිතාරාම විහාරස්ථානයට අනුබද්ධ සංඝ සරණ පදනම දැනට ඕස්ට්‍රේලියාවේ සංඝ සරණ වික්ටෝරියා INC සමඟ සෘජු සබඳතාවයකින් කටයුතු කරනු ලැබේ.

## වර්තමාන තත්ත්වය

දැනට සාමණේර භික්ෂුන් වහන්සේලා 36 දෙනෙකුගේ ගිහි සහෝදර සහෝදරියන් වෙත ශිෂ්‍යත්ව මාසිකව ප්‍රදානය කෙරේ. මාසික ශිෂ්‍යත්ව මුදල රු. 2,000/- කි. 2021 අගෝස්තු මාසයේ සිට තවත් 15 දෙනෙකුට අලුතින් ශිෂ්‍යත්ව ප්‍රදානය කරන අතර, පදනමෙහි අපේක්ෂාව වන්නේ 2021 අවසානය වන විට ශිෂ්‍යත්වලාභීන්ගේ ප්‍රමාණය 50 දක්වා වැඩිකර ලීමයි.

වාර්ෂිකව එක් ශිෂ්‍යත්වයක් ප්‍රදානය සඳහා දායක කල හැකි මුදල රු.25,000/- ක් වන අතර, එලෙස ශිෂ්‍යත්ව ලබාදීමට මුදල් ප්‍රදානය කිරීමට කැමැති ඕනෑම පින්වතෙකුට අදාළ මුදල කොමර්ෂල් බැංකුවේ අංක 8003629846 ගිණුමට බැර කර රිසිට් පත විජිතාරාම විහාරස්ථානය වෙත ඉදිරිපත් කළ හැකිය.

**මුරුතමුරේ පඤ්ඤාලෝක හිමි**
**විහාරාධිපති**